# මහා දේශපාලන ඝාතනයට පනස් වසරක් සපිරෙයි



"කාගේ අවියේ බලෙන් මරණය වැල්ලෙ පියවර ලකුණු එබුවා
අගේ කළ වීරයන් බොහොමයක් ලොවේ මේ ඉරණම ලැබූවා
යුගේ ඒ පිළිබඳව සිහිකොට මගේ දෑ ඉතිහාසය හෙඹූවා
මගේ සිරිලක් මවත් ඒ මුතු වැලට ඇගෙ මුතු ඇටය තැබූවා"

*(යු.ඒ.එස්. පෙරේරා ලංකාදීප 30, සැප්: 1959)*

ලංකාවේ පළමුවන දේශපාලන ඝාතනය වශයෙන් ඉතිහාස ගත වී ඇති සිද්ධියක මේ මාසයේ අඩසියවසක් සපිරේ. (සැප් 26) ඉහත පළවුයේ බණ්ඩාරනායක ඝාතනයෙන් පසු යු.ඒ.එස්. කිවිඳුන් (සිරි අයියා) ලියු අනුවේදනය කවි පෙළක මට තවමත් මතක ඇති කවි වලින් එකකි.

බණ්ඩාරනායක අගමැතිතුමාගේ ඛේදජනක මරණය ගැන නොව එතුමාගේ දේශපාලන, සමාජයීය හා අනෙකුත් සේවයන් පිළිබඳ සවිස්තරාත්මක ඉංගිරිසි ලිපියක් මෙහි වෙනත් පිටුවල පළවන නිසා මේ ලිපිය යු.ඒ.එස්. පෙරේරා ගේ කවි පෙළ පදනම් කරගත් එකක් වන්නේ ය.

"හදගත් දරුවකු නොවේ ඔබ උපන්නේ හෙළ බිමට දව ය. මුදහළ ඊ තලය ලෙස ගොස් නැවතුනේ දියුණුවට යාමය. මෙද බිහිසුණු දමරිකයකු අතින් නැතිවුණු නමුදු ජීවය උදරයි වීරයි විශාලයි අමරණීයයි ඔබගෙ සේවය"

යු.ඒ.එස්. පෙර්රා (සිරි අයියා) දැඩි එක්සත් ජාතික පාක්ෂිකයෙකි. 1956 මැතිවරණයේ දී ඔහු වේදිකාවල කවි කීවේ එජාපය වෙනුවෙනි. බණ්ඩාරනායක ඝාතනයෙන් මාස කිහිපයකට පසු 1960 මැතිවරණ දෙකේ දීම ඔහු කොළොන්නාව ආසනයට තරඟකොට පරාජය වුයේ එජාපයේ අපේක්ෂකයකු ලෙසිනි.



ඉන්දියාවේ හිටපු නියෝජ්‍ය මහ කොමසාරිස්

එස්. පියසේන

> **යු.ඒ.එස්. පෙර්රා (සිරි අයියා) දැඩි එක්සත් ජාතික පාක්ෂිකයෙකි. 1956 මැතිවරණයේ දී ඔහු වේදිකාවල කවි කීවේ එජාපය වෙනුවෙනි. බණ්ඩාරනායක ඝාතනයෙන් මාස කිහිපයකට පසු 1960 මැතිවරණ දෙකේ දීම ඔහු කොළොන්නාව ආසනයට තරඟකොට පරාජය වුයේ එජාපයේ අපේක්ෂකයකු ලෙසිනි.**
>
> **එහෙත් අද බොහෝ මාධ්‍යයන් අරක්ගෙන ඇති දේශපාලන පසමිතුරන්ගේ චරිත ඝාතනය කිරීමේ ඊනියා 'මාධ්‍ය සදාචාරය' එදා කිවියන් හා මාධ්‍යකරුවන් අතර තිබුණේ නැත.**

එහෙත් අද බොහෝ මාධ්‍යයන් අරක්ගෙන ඇති දේශපාලන පසමිතුරන්ගේ චරිත ඝාතනය කිරීමේ ඊනියා 'මාධ්‍ය සදාචාරය' එදා කිවියන් හා මාධ්‍යකරුවන් අතර තිබුණේ නැත.

ඔවුහු දේශපාලන භේදවලින් තොරව පිදිය යුත්තන් පිදු හ.

"මැදුම් පිළිවෙත නමැති ලොව පිළිගත්තු මහ මන්තරය මතුරා
උපන් රට හා ජාතියේ බර රැගත් කාලෙක හිසට පවරා
කටින් පිටකල අයෝමය ගුලි ඉනෙන් ඇදගත් අවිය ගුගුරා
වැදින්නට ගිය දෙවොල හිස පිට කඩා වැටුණා නොවෙද දෙදරා"

1950 දශකයේ නොබැඳි ව්‍යාපාරයේ නිර්මාතෘ වු ශ්‍රී ජවහර්ලාල් නේරු, ආචාර්ය සුකර්ණෝ, අබ්දුල් නසාර් සහ ඇස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක වැනි රාජ්‍ය නායකයන් සිවුදෙනා ගැන සිහිපත් කිරීමට මෙහි පළමුවන පදය යොදගත් බව පෙනේ.

"ළමැද හිල් කළ සැහැසි කමටත් ඔබේ කරුණා ගුණය පෙරුණේ
රද කලවුන් හටත් හිතවත් අයට මෙහි හද මැඳුර ඇරුණේ
විහිද තිරපොට හැරී දුක්මුසු ජවනිකාවකි පළ කෙරුණේ
කවුද බෝ සතු කවුද දෙව්දතු කියා කීමට නොවෙද මැරුණේ"

"ඇයි මට ඒ භික්ෂුව එහෙම කළේ ? ඒ මෝඩ මනුස්සයාට හිරිහැරයක් කරන්න එපා" යනුවෙන් ශල්‍යාගාරයේදී අගමැතිවරයා කළ ප්‍රකාශය පදනම් කරගෙන මේ කවිය ලියැවුණු බව පෙනේ.

"ලාමකව සිතු අයෙකුගෙන් සිය මන්දිරය ඇතුළත නිගා වී
සාමදානය අහිංසකකම තවුතිසා භවනට ළඟා වී
තාම දඬුවම් ලබා නැති ලුත් කුහකු කෝපය සහ වගා වී
දමරික කම සිර ගෙදර රෝහලේ ඇඳ මත ඇත දිගා වී"

මීළඟට සඳහන් වුණු කවිය දේශපාලන ප්‍රතිවාදියකුගේ පාපොච්චාරණයක් ද නැතිනම් හුදු කාව්‍ය සංකල්පනයක් දැයි අපට කිව නොහැක.

"ඔබේ වටිනාකම නොදත් අපි මුහුදු එතරින් ගුණ කියෙව්වෙමු
ලැබේ යැයි සැනසුමක් සිතමින් අන්තිමට හස ගී ගැයෙව්වෙමු
සබේ බැබළුණ චතුරකම දැක ඊට එරෙහිව ඇස පිනෙව්වෙමු
ඊබේ මතුවුණු හතර මත නිදහනක් වළලා දත කියෙව්වෙමු"

ඊට සමානව තවත් කවියකට හැරෙමු.

"වරද දුටු තැන කැපෙන මුවහත තිබුණි ඔබෙ දිව නමැති කඩුවේ
විළඳ මී පැණි කවා කවදත් සාමයේ පරෙවියා වැඩුවේ
සුවඳ පිනිදිය දහර පුරවා තැබූ ලක්දිව මඟුල් මඩුවේ
කවුද ජාතික පුන් කළසෙ පොල් මල රැගෙන එය කැබලි කැඩුවේ"

අගමැතිවරයා බේරා ගැනීමට ලේ අවශ්‍ය බව කී වහාම දහස් ගණන් ජනයා රෝහල අසල පෙළ ගැසුණහ. මේ ගැන යු.ඒ.එස්. පෙරේරා ලියු කවියේ මුල් පද දෙක මට මතක නැත. එහෙත් මතක ඇති අග පද දෙක සඳහන් කරනු වටී.

"ඔබට දීමට තරම් සරිලන සාර සිංහල ලෙයක් කෝ අද
ඇතුට කළු උක් පැණි මිසක් තේ වතුර පෙව්වට වැඩක් වේවිද?....."

අවසාන වශයෙන් මා යොද ගන්නේ මේ මහා ඛේදවාචකය නිසා ජනතාව තුළ ඇති අපේක්ෂා භංගත්වය පිළිබිඹු කිරීමට ලියවුණු කවියයි.

"පෙළට සීගිරි කන්ද බසිනා කසුප් රජුගේ ළඳුන් දුටුවත්
පිනට රට මැද ඉබේ මතුවන රන් පවුම්වල එකට ගැටුවත්
කලට වැසි වස කුඹුරු සරු වී වලාකුළු මැද විදුලි කෙටුවත්
අපට කුමට ද ඉතින් සඳ රැස් කැරැලි සමනළ ගලෙහි නැටුවත්"